රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 253

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1984 ජූනි මස 05 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1981.08.24 දිනැති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වන ඡේදයේ 3 සටහන සංශෝධනය කිරීම**

(I) 2වන ඡේදයේ 3 සටහනෙහි සඳහන් රු.:24,000/= වැටුප් තලය (1982.01.01 දිනට පෙර රු.11,520/=) 1978.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.:25,200/= (1982.01.01 දිනට පෙර රු.12,480/=) වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

(II) හිඟ වැටුප් ගෙවිය යුත්තේ 1984.03.07 දින සිට පමණි.

2. (I) නිලධාරියෙකු රු.25,200/= වැටුප් තලයෙහි පිහිටුවීම මම කරන්නෙමි. මෙම වැටුප් තලයෙහි පිහිටුවනු ලැබීමට සුදුසුකම් ඇති නිලධාරියෙකු, මේ සමඟ අමුණා ඇති ආකෘතිය ප්‍රකාර ඉල්ලීම සිය අමාත්‍යාංශයේ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

(II) අමාත්‍යාංශයේ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා එම ඉල්ලුම්පත්‍රයේ II වන කොටස සම්පූර්ණ කර එය මා වෙත ඉදිරිපත් කළ යුතුය.

3. 1978.07.01 දින සිට 1984.03.07 දින දක්වා කාලයතුල රු.24,000/= (1982.01.01 දිනට පෙර රු.11,520/=) වැටුප් තලය මත පිහිටුවනු ලැබූ, විචෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයට බඳවා ගත් නිලධාරීන්ගේ වැටුප් නැවත සකස් කළ යුතු වේ. අමාත්‍යාංශයේ ලේකම්/ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා

(අ) නියමිත දිනයේදී අදාල නිලධාරියා රු.25,200/= වැටුප් තලය මත පිහිටුවනු ලැබුවා සේ සැළකිය යුතුය.

(ආ) ඒ පදනම මත ඔහුගේ වැටුප නැවත සකස් කළ යුතුය.

(ඇ) හිඟ වැටුප් රහිතව 1984.03.07 දින සිට ඔහුගේ නව වැටුප ගෙවිය යුතුය.

(ඈ) ඔහු නව වැටුප මත පිහිටුවන ලිපියේ පිටපතක් මා වෙත එවිය යුතුය.

( බී. අයි. ගුණතුංග )
අතිරේක ලේකම්,

අ.ක./ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,

1. (අ) නිලධාරියාගේ නම :-

(ආ) පන්තිය/ශ්‍රේණිය සහ එයට පත්වූ දිනය :-

2. වර්තමාන තනතුර සහ දෙපාර්තමේන්තුව :-

3. (අ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගත් දිනය :-

(ආ) බඳවා ගත් පිළිවෙල* :-
- විවෘත තරඟ විභාගයෙන්
- සීමිත තරඟ විභාගයෙන්
- පූර්ණ වෘත්තීය සුදුසුකම් මත

( * නොගැළපෙන දෑ කපා හරින්න)

4. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගත් දිනය වනවිට අඛණ්ඩ ස්ථිර රාජ්‍ය සේවය පිළිබඳ විස්තර :-

5. පහත සඳහන් විභාගවලින් සමත්/නිදහස් ද යන වග: එසේනම්, ඒ පිළිබඳ විස්තර:-

පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය :-
දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය :-

දෙවැනි භාෂා පරීක්ෂණය:-

6. වර්තමාන වාර්ෂික වැටුප:-

7. ඉල්ලුම් කරන ලද වැටුප් තලය :-

8. මෙය ඉල්ලුම් කරන්නේ කවදා සිට ද යන වග :-

1 – 6 දක්වා වූ ඡේදවල සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බවත්, 7 වන ඡේදයේ ඉල්ලුම් කර ඇති වැටුප් තලය 8 වැනි ඡේදයේ දැක්වෙන දින සිට ලැබීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

අත්සන: ......................

දිනය:-...............

වෙ/

II වන කොටස

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය සහ නියෝගය

..................................මහතා/මහත්මිය/මෙනවිය ......................................

විසින් මෙම ආකෘතියේ සපයා ඇති තොරතුරු පරීක්ෂා කළ බවත්, ඒවා නිවැරදි බවත් මම සහතික කරමි. ගතවූ අවුරුදු හය තුළ ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව ** පැවතුනි. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 2 වන ඡේදය ප්‍රකාර.............. වැනි දින සිට රු................/= වැටුප් තලයේ පිහිටුවීමට ඔහු/ඇය සුදුසුකම් ලබා තිබේ.

අමුණා ඇති ලිපියේ සඳහන් හේතූන් මත මෙම ඉල්ලීම අනුමත නොකරමි.

(** නිලධාරියකු නියමිත කාලය තුළ නියමිත දිනයන්හිදී වැටුප් වර්ධක උපයාගෙන ඇත්නම් සහ එම කාලය තුළ කර ඇති වරදක් සඳහා විනයානුකූලව දඩුවමකට භාජනය වී නොමැති නම් ඔහුගේ සේවය සතුටුදායකයයි නිගමනය යුතුරේ)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :-

දිනය :-